# ඥානවිභාගයෙහිලා සංශයවාදය ශික්ෂණ ප්‍රතිපත්තියක් ලෙස ඇගයීම පිළිබඳ අධ්‍යයනයක්

ආර්. පී. ඩී. එම්. රාජපක්ෂ[1]

## හැඳින්වීම

මෙම පර්යේෂණයේ මූලික තේමාව වන්නේ දර්ශන විෂයට අයත් ප්‍රධාන උප විෂයක් වන ඥානවිභාගය යටතේ ගැනෙන චින්තනයක් වන සංශයවාදී දර්ශනවාදය යි. බටහිර හා භාරතීය දාර්ශනික සම්ප්‍රදායන්හි ඍජු හා වක්‍ර ආකාරයන්ගෙන් මුල් යුගයේ සිට ම අතිශය ස්වභාවිකව මානව සිත් සතන්වලින් නෛසර්ගිකව පැන නැගෙමින් පවත්නා සංශයවාදී චින්තාවන් ඥානයෙහි නව මං පෙත් විවර කිරීමෙහිලා කරන ලද මෙහෙය ප්‍රශංසනීය බව කිව යුතු ය. මෙම සංශයවාදී චින්තා පිළිබඳ තුලනාත්මක වූ ද මූලාශ්‍රමය අධ්‍යයනයක් මෙහිදී සිදු කෙරෙන්නේ ඒවායෙහි අන්තර්ගත සදාචාරාත්මක නොහොත් ආචාර විද්‍යාත්මක පදනම් කෙරේ ද අවධානය යොමු කරමිනි. බටහිර දර්ශනයේ සංශයවාදී චින්තනයේ උච්ඡතම අවස්ථාව සනිටුහන් කරන පයිරෝ නමැත්තා ඉදිරිපත් කරන සංශයවාදය හා භාරතීය අමරාවික්ඛේපවාදීන් නමින් හැඳින්වෙන සංශයවාදී ගුරුකුලවල චින්තා මේ යටතේ හැදෑරීම සිදු කෙරෙන්නේ බුදුදහමෙන් ප්‍රකට සංශයාත්මක පෙළඹවීම් කෙරේ ද අවධානය යොමු කරමිනි.

## ඥානවිභාගයෙහිලා සංශයවාදය ශික්ෂණ ප්‍රතිපත්තියක් ලෙස ඇගයීම

ප්‍රපඤ්ච මනුෂ්‍යයාට වාස්තවික, විෂය මූලික සර්ව සම්පූර්ණ ඥානයක් ලබා ගත නොහැකි යැයි අදහස් පළ කරන වාදය සංශයවාදය නොහොත් සංදේහවාදය යි. එය වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, පිළිගත නොහැකි තීන්දු, තීරණ නොහොත් විනිශ්චයන් අත්හිටුවීම මත මනසේ ගොඩනැගුණු ශාන්තභාවය සංශයවාදය යි. දාර්ශනික වශයෙන් එය වෛද්‍යමය රූපකයක් මෙන් ම අධිභෞතිකමය, සදාචාරාත්මක හා ඥානවිභාගාත්මක තත්ත්වයන් නිසා උපත ලද ඥානමය හා භාවමය රෝගයන්ගෙන් මිනිසා සුවපත් කරන දාර්ශනික ප්‍රතිකාරයකි. බෞද්ධ සූත්‍ර දේශනා පිරික්සීමේදී බුදුසමය ද සංශයවාදය නමින් ම නොමැතිවුවත් විමර්ශනාත්මක අභිරුචිය කෙරේ ප්‍රතිජානාත්මක ආකල්පයක් විදහා දක්වා ඇති අයුරු පෙනී යයි.

විශ්වය පදනම් කරගත් සංශයාත්මක හැඟීම් මනුෂ්‍යා වෙත යොමු කළ සොක්‍රටීස් ඥානවිභාගයෙහිලා විමර්ශනාත්මක අභිරුචියත් සදාචාරයත් අවධාරණය කළේ එකිනෙකින් වියුක්ත විෂය ලෙස නොව එක ම දාර්ශනික පදනමක ප්‍රායෝගිකව ය. මානව ඥානයේ ශක්‍යතාව හා සීමා පිළිබඳ අවධානය යොමු කළ

---

[1] සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, dilshanmanojrajapaksha@gmail.com

පයිරෝනියානු සංශයවාදය (Pyrrhonian Skepticism) මිනිසාට ඥාන ශක්තියේ පරිපූර්ණ අවස්ථාවකට පැමිණීම කෙලෙසින් වත් කළ නොහැකි දෙයක් බව විශ්වාස කළේ ය. "දෙවියන්වහන්සේ" යන සංකල්පය ඇතුළු අධිභෞතික සත්තාවන් බැහැර කිරීම කෙරේ වැඩි අවධානයක් යොමු කොට එබඳු අදහස් ඉදිරිපත් කරන්නන් කෙරේ සදාචාර විරෝධී ම්ලේච්ඡයන් යනුවෙන් චෝදනා කරමින් උරණ වූ මෙම චින්තනය මානසික සංහිඳියාව සදාචාරාත්මක ශික්ෂණය පිණිස ඥානයෙහි සීමා අවධාරණය කර ඇත. එසේ ම කිසිවෙකුගේ ඉගැන්වීමක් කෙරෙහි නිශ්චයක් නොකළ යුතු බවත් ඉක්මණින් කිසි ම දෙයක් ගැන පිළිත නොදිය යුතු බවත් හැමවිට ම සැක සහිතව ජීවත් විය යුතු බවත් අවධාරණය කළ මෙම චින්තකයන් සදාචාරාත්මක ඥාන ගවේෂණයෙහිලා සංශයවාදය උත්කෘෂ්ට බව සලකා ඇත. මුනිවරයෙක් හා ශාන්තුවරයෙක් ලෙස හඳුන්වන පයිරෝ භාරතයට පැමිණ අධ්‍යාපනය හැදෑරූ බව බොහෝ මූලාශ්‍ර සනාථ කරයි.

විවාදාත්මක කරුණුවලදී නිශ්චිත නිගමනයකට නොපැමිණ විවිධ අදහස් ඒ මේ අතට මාරු වෙමින් ප්‍රශ්නයට පිළිතුරු දුන්හ අමරාවික්ඛේපවාදීන්ව වාද විවාද සඳහා අවශ්‍ය නිශ්චිත කරුණක් නොදුන් බැවින් චෝදනා කිරීම සඳහා අල්ලා ගැනීමට ප්‍රතිවාදියා අසමත් වන්නේ නිසර්ගයෙනි. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් සංශයවාදී ගුරුකුල ප්‍රධාන කොටස් දෙකක් යටතේ දැක්විය හැකි ය. මුසාවාදය ප්‍රතික්ෂේප කළ පිරිස, උපාදානය ප්‍රතික්ෂේප කළ පිරිස හා අනුයෝගය ප්‍රතික්ෂේප කළ පිරිස සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක අංශයන් කෙරේ නැඹුරුව සංශයවාදය ඉදිරියට ගෙන ගිය සංශයවාදී ගුරුකුල එහි පළමු කොටස ලෙස දැක්විය හැකි අතර ඒවායෙහි මූලික චින්තා ඥානවිභාගයෙහිලා මෙම සාකච්ඡාවේදී අවධානය යොමුකෙරෙන සදාචාරාත්මක ශික්ෂණය පිණිස අතිශය වැදගත් වේ. මෙම සූත්‍රයේ සඳහන් දෙවන කොටස වන සදාචාරාත්මක හෝ අඥානකත්වය මත සංශය මෙහෙය වීම් කළ පිරිස මනෝවිද්‍යාත්මක අංශවලටත් වඩා අඥානකම පාදක කොට ගෙන සංශයවාදය ඉදිරියට ගෙන ගිය සංශයවාදී ගුරුකුලය ලෙස දැක්වෙන නමුත් අඥානභාවය මුල් කොට ගත් විමර්ශනයකදී නම්‍යශීලී හා සාතිශය මධ්‍යස්ථ මතයක් වෙත ගමන් කිරිමට මෙන් ම සදාචාරවත් පිළිවෙතකට ද ඉවහල් වන බව දැක්විය යුතු ය.

පෙර අපර දෙදිග සංශයවාදී චින්තනය සලකා බලන විට එමගින් ප්‍රකට වන මූලික ලක්ෂණ කිහිපයක් දකිය හැකි අතර ඒවායෙහි අනතර්ගතය දක්වන සාතිශය සදාචාරවත් පෙළඹවීම මතු කරගැනීමට එතරම් පරිශ්‍රමයක් දැරිම අනවශ්‍ය බව කීම අතිශෝක්තියක් නොවේ. එලෙස දැක්විය හැකි සංශයවාදී චින්තනයේ මූලික ලක්ෂණ නම්, සංශයාත්මක පෙළඹීමක් මත විමර්ශනාත්මක අභිරුචිය අවධාරණය කිරීම, අන්තවාද බැහැර කිරීම, සදාචාරාත්මක නැඹුරුව, මනෝභාව පිළිබඳ මධ්‍යස්ථතාව, වාදශීලී බව ප්‍රතික්ෂේප කිරීම, ව්‍යාජ හෙවත් ප්‍රෝඩාකාර මෙන් ම ගුඪ මතවාද බැහැර කිරීම, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ දුබලතා පෙන්වාදීම, සර්ව සම්පූර්ණ ඥානය ප්‍රතික්ෂේප කිරීම හා ඥානයෙහි සීමාවලින් ඔබ්බට යාමෙහි නොහැකි බව හා එහි අනවශ්‍ය බව පෙන්වාදීම යනාදිය යි. සංශයවාදී චින්තනයේ

මෙම මූලික ලක්ෂණ බොහෝ විට බුදුදහම සමග බොහෝ සෙයින් තුල්‍ය වන ලක්ෂණ දැරුව ද, බුදුසමය කිසිසේත් ම සංශයවාදයක් ලෙස ගැනීම උචිත නොවේ.

**සමාලෝචනය**

සංශය, සංශය උදෙසා ම භාවිත කළ පිරිසත්, සංශය නිශ්චිත වූ සුවිශේෂී පරමාර්ථයක් උදෙසා භාවිතා කළ පිරිසත් සමස්තයක් ලෙස ගෙන එයින් බුදුදහම වෙන ම පිහිටුවා සාකච්ඡා කළ හැකි කරුණක් ද මෙහිදී පෙනී යයි. එනම්, බුදුදහම හැර සංශයවාදී චින්තාවන් පිළිබිඹු කරන අනෙකුත් සියල්ලක් ම බුද්ධිවාදී ස්ථාවරයක් වෙත පිය නගන බුද්ධිවාදී චින්තාවන් ලෙස හඳුනා ගැනීමට හැකි වන විට බුදුදහම අනුභූතිවාදී ස්ථාවරයක් මත පදනම් වෙමින් විමර්ශනාත්මක අභිරුචිය මෙහෙයවීම යි. බුද්ධිවාදි ඥාන මාර්ග බැහැර කොට අනුභූතිවාදී ප්‍රවේශයකින් ඥානය අවධාරණය කිරීම පමණක් නොව, අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ද අවධාරණය කිරීම හා සියලු දුක් නැති කොට නිවන් අවබෝධ කර ගැනීමට මග පෙන්වාදීම අතින් ද බුදුදහම සංශයවාදී දර්ශනයෙන් වෙනස් වන බව පෙනේ. අනෙක් අතට සංශය මෙහෙයවා ප්‍රතිවේධයක් අවධාරණය කළ පිරිස් අතරින් ද බුදුදහම සුවිශේෂී වන්නේ, ප්‍රායෝගිකව සියලු දෙනාට අවබෝධ කළ හැකි නිර්වාණය නම් වූ ආධ්‍යාත්මික මාර්ගයක් ඉදිරිපත් කළ බැවිනි. ඒ අනුව බුදුදහමෙන් ප්‍රකට වන සංශයවාදී ප්‍රවණතා ඥානවිභාගයෙහිලා දක්වන නැමියාව පුද්ගල හා සාමාජීයීය යන දෙඅංශයේ ම ආධ්‍යාත්මික වශයෙන් සදාචාරාත්මක පදනමක් අවධාරණය වන්නේ ය.

**ප්‍රමුඛ පද:** සංශයවාදය, ශික්ෂණය, ඥානවිභාගය, බුදුදහම, ආධ්‍යාත්මික මාර්ගය

**ආශ්‍රිත ග්‍රන්ථ**

රාජපක්ෂ, ආර්. පි. දිල්ශාන් මනෝජ්, (2014). *සර්වඥතා ඥානය පිළිබඳ සංශයවාදී හා බෞද්ධ දාර්ශනික ස්ථාවරයන් විමසා බැලීම,* පියසිරි, ස්වර්ණා. බහුවිධ ශික්ෂණයන්ට එළඹුම පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, ජ'පුර විශ්වවිද්‍යාලය, පි. 54.

රාජපක්ෂ, ආර්. පි. දිල්ශාන් මනෝජ්, (2014). *සංශයවාදය පිළිබඳ බෞද්ධ විග්‍රහයක්.* රාජකීය ආසියාතික සංගමයේ 7වන පර්යේෂණ සම්මන්ත්‍රණය. කොළඹ 07, පි. 157.

රාජපක්ෂ, ආර්. පි. දිල්ශාන් මනෝජ්, (2012). *සංශයවාදය හා ඥානයෙහි සීමා පිළිබඳ ගැටලුව: බෞද්ධ දාර්ශනික විග්‍රහයක්,* කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ බෞද්ධ අධ්‍යයනය ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධය, පි. 133.



BHIKSHU UNIVERSITY OF SRI LANKA
07 APR 2015
LIBRARY